# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, අංක.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7

J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/Notice/D/Div/2024 | ඔබගේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.05.14 |

WBB/Circular/No.12/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/නියෝජ්‍ය සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත,

<u>සමාජ ආරක්ෂණ දත්ත ලේඛනයේ අඩංගු දත්ත යාවත්කාලීන කිරීම</u>

1.හැඳින්වීම:

1.1 සුභසාධක ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවෙන් පළමු අදියරේදී අයදුම්පත් ඉදිරිපත් කරන ලද තැනැත්තන් /පවුල්වල දත්ත ඉලෙක්ට්‍රොනික සමාජ ආරක්ෂණ දත්ත ලේඛනයකට ඇතුලත් කර ඇත.

1.2 එම ලේඛනය තුළින් නියමිත උපමාන හා දර්ශක පදනම් කරගෙන ලකුණු ලබා දීමේ ක්‍රමය මත දුප්පත්කම මැනීමෙන් සමාජ කාණ්ඩ හතරක් යටතේ අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබන්නන්ගේ ලැයිස්තුවක්ද සකස් වී ඇත.

1.3 2002 අංක 24 දරණ සුභසාධක ප්‍රතිලාභ පනතේ 23 වැනි වගන්තිය අනුව ප්‍රතිලාභ ලබන සහ නොලබන පුද්ගලයින්/පවුල්වල දත්ත අඩංගු මෙම සම්පූර්ණ ලේඛනය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුවේ.මෙම ක්‍රියාවලිය දත්ත නැවත සහතික කිරීම ( recertification ) යනුවෙන්ද හඳුන්වනු ලැබේ.

1.4 පනතේ 23 වගන්තිය අනුව මෙම දත්ත යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මතයට අනුව නියමිත උපමාන වලට අනුව ඉටු කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීමක් බව පැහැදිලිව සඳහන්වේ.

1.5 සුභසාධක ප්‍රතිලාභ අපේක්ෂා කරන්නන් වෙතින් අයදුම්පත් කැඳවා තෝරා ගැනීම සිදුකිරීමේ ක්‍රියාවලියට අදාල ක්‍රියාපටිපාටිය හා තෝරාගැනීමේ උපමාන, දර්ශක ආදිය අදාල කරගැනීමට අදාල ක්‍රමවේදය මෙම පනත යටතේ 2022 ඔක්තෝබර් 20 දිනැති අංක 2302/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රෙය් පලකර ඇති නියෝග 2022 දෙසැම්බර් 15 දිනැති අංක 2310/30 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රෙය් පලකරන ලද එහි සංශෝධන හා 2024 අප්‍රේල් මස 29 දිනැති අංක 2382/02 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රෙය් පලකරන ලද එහි සංශෝධනද මඟින් පැහැදිලිකර ඇත.

Welfare Benefits Board


| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | Tel: 009411-2151481<br>009411-2484600/4117<br>Fax: 009411-2151482 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல்<br>e-mail | welfarebenefitboard2016@gmail.com<br>info@iwms.wbb.gov.lk | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.wbb.gov.lk |


Scanned with CamScanner

තවද ඉහත සඳහන් අවසන් වරට සිදු කරන ලද නියෝග සංශෝධනය තුළින් 23 වන වගන්තිය ප්‍රකාරව දත්ත යාවත්කාලීන කිරීම සඳහා මෙම නියෝග අදාල කරගත යුතු බවද සඳහන් වේ.

1.6 ඉහත 1.3, 1.4 හා 1.5 මඟින් පෙන්වාදී ඇති නීතිමය පසුබිම තුළ කළයුතු කාර්යභාරය පිළිබඳ උපදෙස් මෙම චක්‍රලේඛය මඟින් නිකුත් කරනු ලැබේ

2 .දත්ත යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ දී මූලික වශයෙන් සැලකිල්ලට ගතයුතු විශේෂ කරුණු:-

2.1 පළමු අදියරේ ඉදිරිපත් වූ දත්ත සංගනනය කිරීම තුළින් හා තේරීම් කමිටුවල පරීක්ෂණ කිරීමෙන් පසුව සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව (අභියාචනා ක්‍රියාවලියට යටත්ව) දත්ත පද්ධතියට ඇතුලත්ව ඇති දත්තවල අදාල සියළුම අයදුම්කරුවන් (ප්‍රතිලාභ ලබන සහ නොලබන) අනිවාර්යෙන්ම නියමිත දිනට පෙර තම දත්ත යාවත්කාලීන කළ යුතුද නැත්ද යන්න ප්‍රකාශ කළ යුතුයි.

2.2 යම් තැනැත්තෙකු එසේ දත්ත යාවත්කාලීන කිරීමට ඉදිරිපත් නොවුවහොත් එම තැනැත්තා ( සහ එම පවුලේ සාමාජිකයින්) දැනට ලබන ප්‍රතිලාභ අහිමිවීමට සහ ඉදිරියේ දී වෙනත් ප්‍රතිලාභය සඳහා හිමිකම් නොලැබීමට හේතු වනු ඇත.

2.3 අයදුම්කරුවන්ගේ දත්ත සංශෝධන ඉදිරිපත් කිරීමෙන් පසුව දත්ත නැවත සංගනනය කිරීම හෝ සුදුසු ආකාරයකින් කරුණු පරීක්ෂා කර තේරීම් කමිටු ක්‍රියාවලිය තුළින් නිවැරදි ලෙස දත්ත සංශෝධනය කිරීම හෙවත් දත්ත නැවත සහතික කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීම වේ. (පනතේ 23 වගන්තිය කරු. බලන්න)

2.4 දත්ත යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙල පිළිබඳව ජනතාවට පූර්ව දැනුවත්භාවයක් ලබාදීම සඳහා පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.මේ සඳහා ජාතික මට්ටමින්ද දායක වේ.

3.දත්ත යාවත්කාලීන කිරීමේ ක්‍රියාපටිපාටිය:-

3.1 පුද්ගලයින් විසින් ඉදිරිපත්ව ඇති දත්ත සමාජ ආරක්ෂණ දත්ත ලේඛනයේ දැනට යාවත්කාලීන කිරීම

3.1.1 පළමු අදියරේදී අයදුම්පත් ඉදිරිපත්කර ලියාපදිංචි වී සිටින දැනට ප්‍රතිලාභ ලබන සහ නොලබන සියළුම තැනැත්තන් තම දත්ත යම් කිසිවක් සංශෝධනය විය යුතුද එසේ නැතිනම් කිසිදු සංශෝධනයක් සිදු නොවන්නේද යන්න පිළිබඳව කරුණු ඉදිරිපත් කළ යුතු බවට ජනතාවට පුළුල් ප්‍රචාරයක් ලබා දීම දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කිරීමට කටයුතු කල යුතුවේ.

3.1.2 අයදුම්කරුවන්ට IWMS දත්ත පද්ධතියට මාර්ගගත ක්‍රමයට පිවිස තම දත්ත සංසන්දනය කිරීමට අවශ්‍යද නැද්ද යන්න ප්‍රකාශ කිරීමට සැලැස්විය යුතුයි.

Welfare Benefit Board
WBB
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office | Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail | welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk | වෙබ් අඩවිය / இணையதளம் / Website | www.wbb.gov.lk

Scanned with CamScanner

එසේ තමන් විසින්ම දත්ත පද්ධතියට පිවිසීමට අපහසු තැනැත්තන්හට තම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුභසාධක ප්‍රතිලාභ ඒකකය වෙත පැමිණ එම ඒකකයේ නිලධාරීන් මඟින් තමා ඉදිරිපිටදී එම කාර්යය ඉටුකිරීමට ඉඩ සලසා දිය යුතුයි.

(මේ සඳහා අයදුම්කරුවන් වැඩියෙන් පැමිණෙන දිනවලදී අතිරේක නිලධාරීන් හා උපකරන යොදවා තදබදය අඩු කිරීමට විශේෂ වැඩපිළිවෙලක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.)

3.1.3 දත්ත සංශෝධනය කිරීමට අවශ්‍ය පුද්ගලයින්ට මෙම දෙයාකාරයෙන් එක් ආකාරයකට දත්ත පද්ධතිය තුළින් දත්ත සංශෝධනය කල හැක. දත්ත සංශෝධන කිසිවක් නොමැති යයි අදහස් කරන අයදුම්කරුවන්ට ඒ බව පද්ධතියට ඇතුලත් කළ හැකියි.

3.2 ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දැනට හඳුනාගෙන ඇති අස්වැසුම ප්‍රතිලාභී ලේඛනයෙන් ඉවත් කළ යුතු යයි හෝ ප්‍රතිලාභී ලේඛනයට ඇතුලත් කළ යුතුයැයි හැඟෙන පුද්ගලයින්ගේ දත්ත.

3.2.1 මෙවැනි දෝෂ සහිත බවට හඳුනාගත් පුද්ගලයින්ගේ දත්තවල නිවැරදිභාවය පරීක්ෂා කිරීම සඳහා හා යාවත්කාලීන කල දත්ත සනාථ කිරීම සඳහා නැවත සංගණනයකට යොමුකර එම ප්‍රතිඵල මත ඉදිරි පියවර ගත යුතුයි.

3.3 නියමිත දින වන විට ( ක්‍රියාවලිය ආරම්භ කරන දිනය හා තොරතුරු ඉදිරිපත් කිරීමේ අවසන් දිනය ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.) දත්ත සංශෝධන කරන ලද හෝ සංශෝධන නොමැති බවට යාවත්කාලීන කරන ලද අයදුම්කරුවන්ගේ දත්ත දැනට අලුතින් පත්කර ඇති තේරීම් කමිටුව මඟින් පරීක්ෂා කර නිවැරදි කිරීම සිදුකර අනුමත කළ යුතුවේ.

3.4 තේරීම් කමිටු විසින් තම අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන වශයෙන්ම දැනට පත්කර ඇති සංගනන නිලධාරීන් යොදවා දත්ත නැවත සංගනනයට ලක්කර එම ප්‍රතිඵල යොදාගත යුතුවේ. සමහර දත්ත නැවත සංගනනයකින් තොරව පිළිගතහැකි සාක්ෂි මත තහවුරු කරගත හැකි නම් ඒ අනුව ක්‍රියාකළ හැක ( උදාහරණ වශයෙන් විදුලි පරියෝජනයට අදාලව විදුලි බිල්පත් පරීක්ෂා කිරීමෙන් තහවුරු කරගත හැකියි.)

3.5 තේරීම් කමිටුව විසින් දත්තවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමේදී අයදුම්කරුවන් විසින් සංශෝධනය කළ සහ නොකළ සියළුම දත්ත නැවත පරීක්ෂාවට ලක් කර නිවැරදි කිරීමට පියවර ගත හැකියි. ඒ සඳහා නැවත සංගනනය කිරීමේ තොරතුරු, සාක්ෂි කැඳවීමකින් ලබා ගන්නා තොරතුරු , පුද්ගලයින් කැඳවා ලබාගන්නා තොරතුර හා දත්ත සහතික කරගත හැකි ආයතන වලින් දත්ත පරීක්ෂා කිරීම තුළින් හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ හැකියි.

3.6 තේරීම් කමිටුව විසින් දත්ත නිවැරදි කිරීමෙන් පසුව පරිගනක පද්ධතිය තුළින් ගනනය වනු ලබන ලකුණු අනුව තේරීම් ලැයිස්තු සංශෝධනය වනු ඇත.

3.7 ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත්ව ඇති තොරතුරු අනුව යම්කිසි අයදුම්පත්කරුවෙක් ලබන ප්‍රතිලාභ යම් කාණ්ඩයක් සඳහා සුදුසුකම් ලැබිය යුතු බවට පැහැදිලිවම හා බැලූ බැල්මට පෙනියන බව තේරීම් කමිටුව හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අදහස් කරන්නේ නම් හෝ යම් පුද්ගලයකුට පහත සඳහන් තුන් වර්ගයකින් එකකට අයත්ව සිටියදී,

Welfare Benefits Board
WBB
Sri Lanka



Scanned with CamScanner

1. දත්ත සංශෝධන ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ දත්ත වලට අදාලව
2. දත්ත යාවත්කාලීන කිරීමට අවශ්‍ය නැති බවට ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ දත්ත වලට අදාලව
3. දත්තවල යාවත්කාලීන කිරීමට නියමිත දිනට ඉදිරිපත් නොවූ අයදුකරුවන්ගේ අයදුම්පත් වලට අදාලව

ඔහු යම් ප්‍රතිලාභයකට සුදුසුකම් ලබා ඇතත් තේරීම් කමිටුවේ පරීක්ෂා කිරීමෙන් පසුව එම තැනැත්තා අස්වැසුම සුදුසුකම් ලබන්නන්ගේ ලේඛනයෙන් ඉවත් කර සමාජ ආරක්ෂණ දත්ත ලේඛනයේ පමණක් තබා ගැනීම හෝ කාණ්ඩය සංශෝධනය කිරීම හෝ සංශෝධනයෙන් ගනු ලබන තීරණ මත ප්‍රතික්ෂේප කිරීමෙන් තේරීම් කමිටුව විසින් තීරණය කළ හැක. මෙම තේරීම් කමිටුවේ තීරණ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතියට යටත්වේ. එබැවින් මීට අදාලව තබාගන්නා ලද සාක්ෂි මත නිර්දේශයක් වෙනම මණ්ඩලය වෙත එවිය යුතුයි.

3.8 දත්ත යාවත්කාලීන කිරීම සඳහා නියමිත දිනට ඉදිරිපත් නොවූ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබා සිටි අයදුම්කරුවන් එම ප්‍රතිලාභ ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.ප්‍රතිලාභී ලේඛනයේ නොමැති එවැනි අයදුම්කරුවන් නැවත දත්ත සහතික කිරීමකින් තොරව ඉදිරියේදී කිසිදු ප්‍රතිලාභයක් සඳහා හිමිකම් නොලබනු ඇත.

3.9 තේරීම් කමිටුව විසින් සංශෝධිත දත්ත අනුමත කිරීමෙන් පසුව සකස් කරනු ලබන ලැයිස්තු ප්‍රාදේශීය ලේකම්ගේ පිටසන සමඟ මා වෙත එවිය යුතුය. මවිසින් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සකස් කරනු ලබන සංශෝධිත සමාජ කාණ්ඩ යටතේ නියමිත ප්‍රතිලාභ 2024 ජූලි මාසයේ සිට ගෙවීමට පියවර ගනු ලැබේ.

3.10 IWMS පරිගණක පද්ධතිය තුළින් ඉහත ක්‍රියාවලිය සිදුකරන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ වෙනම නිකුත් කරනු ලැබේ.

3.11 මෙම දත්ත යාවත්කාලීන කර සහතික කිරීමේ ක්‍රියාවලිය සඳහා වූ කාල රාමුව ඇමුණුම I වශයෙන් ඉදිරිපත් කර ඇත.

Welfare Benefits Board
WBB
Sri Lanka

ඉහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් මෙම දත්ත යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ඔබේ උපරිම සහාය ලබාදෙන මෙන් කාරුණිකව දන්වමි.

ජයන්ත විජේරත්න
සභාපති /කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk

Scanned with CamScanner

පිටපත්:-

1) ලේකම්,මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි
2) ලේකම්,රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය- කා.දැ.ගැ.පි
3) ලේකම්,කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - (ප්‍රා.ලේ.කාර්යාල වලට අනුයුක්ත සුභසාධක විෂයට අදාල ක්ෂේත්‍ර නිලධාරින්ගේ සහාය ලබාදීම පිණිස)
4) අධ්‍යක්ෂ ජනරාල්,ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.පි
5) අධ්‍යක්ෂ ජනරාල්, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - (ප්‍රා.ලේ කාර්යාල වලට අනුයුක්ත නිලධාරින්ගේ සහාය ලබාදීම පිණිස)
6) සියළු දි.ලේ.වරුන්/අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් - (තම දිස්ත්‍රික්කය තුළ මෙම ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරිමට)

කාර්යාලය
அலுவலகம்
Office
Tel: 009411-2151481
009411-2484600/4117
Fax: 009411-2151482
විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
e-mail
welfarebenefitboard2016@gmail.com
info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය
இணையதளம்
Website
www.wbb.gov.lk

Scanned with CamScanner